**ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව - 2023**

**------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ලග්ගල-පල්ලේගම ප්‍රාදේශිය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ලග්ගල-පල්ලේගම ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ රු 340,400.ක ලැබිය යුතු මුද්දර ගාස්තු ගිණුම්ගත කර නොතිබුණි. | 2024 අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදි කරන බව. | -එම- |
| (ආ) | ඉකුත් වර්ෂයේ බිල්කිරීම් ලෙස හදුනා නොගත් සමාලෝචිත වර්ෂයේ ලැබී තිබුණු රු 473,520.ක මුද්දර ගාස්තු ආදායම් සමුච්චිත අරමුදල් ගිණුමට බැර නොකර ආදායම් ණයගැති ගිණුමට බැර කර තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසන් දිනට ශේෂ පත්‍රයේ දැක්වෙන ස්ථාවර වත්කම් ශේෂය රු 64,842,871.ක් වූ අතර ප්‍රාග්ධන යෙදුමට අදායමින් හා ආධාර වලින් දායකවීමේ ගිණුම් වල එකතුව රු 60,765,733.ක් වූයෙන් රු 4,077,098. ක වෙනසක් විය. | -එම- | -එම- |
| (ඈ) | මීය යාත්මක කල ග්‍රාවර්ෂයේ ක්‍රි 2021 කට අදාළව අතරුදවූම් 05 පෘතිමාර්ග ව්‍යා ශය වාහන හා මහා මාර්ග අමාත්‍යාංමුදල ප්‍ර විසින්සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේදී සභාවේ බැංකු ගිණුමට ප්‍රේෂණය කර තිබුණු ද,එම රු 652,961.ක් ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඉ) | ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියෙන් ලැබී තිබුණු එකතුව රු.180,000 ක යතුරු පැදි ක ගිණුම්ගත 02 .කර නොතිබුණි | 2024 අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | පිටවල සංචාරක නිවාඩු නිකේතනය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට වැයකර තිබුණු රු 2,946,860.ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | -එම- | -එම- |
| (උ) | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මගින් ලැබී තිබුණු රු 329,592.ක් වටිනා ලිබඩු හා කාර්යාල උපකරණ, රු 950,196.ක් ලෙස ප්‍රාග්ධනිත කිරීම හේතුවෙන් රු 620,604.ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඌ) | සමාලෝචිත වර්ෂය තුල රු 71,380.ක අත්තිකාරම් පියවා තිබුණද තවදුරටත් නොපියවූ අත්තිකාරම් ලෙස මූල්‍ය ප්‍රකාශන තුල දක්වා තිබුණි. | -එම- | -එම- |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයන් 15 ක ශේෂයන් ඊට අදාල ලේඛන හා උපලේඛන සමඟ සැසඳීමේදී රු.24,644,940ක නොසැසඳීමක් විය. | උප ලේඛනවල දෝෂ සහිත බවක් පවතින අතර උපලේඛන නිවැරදි කිරීමට කටයුතු කරන බව | නොසැසඳීමට අදාල කරුණු පරීක්ෂා කර නිවැරදි කළ යුතුය. |

### 1.6.3 අවිනිශ්චිත ගිණුම

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට පැවති රු 2,241,938.ක අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය සමාලෝචිත වර්ෂයේදීත් නිරවුල් කර නොතිබුණි. | 2014 පෙර ඇති වී ඇති අතර වෙනස සොයා ගැනීමට ලිපිලේඛන නොමැති බව. | ශේෂ හඳුනාගෙන නිරවුල් කල යුතුය. |

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන එකතුව රු18,892,348ක වත්කම් විෂයන් 09 ක් හා රු.70,489 ක බැරකම් ශේෂයකට අදාළ ලේඛන, ලිපිගොනු හා උපලේඛනඉදිරිපත් නොකිරීම හේතුවෙන් , ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය | විෂයයන්ට අදාළ පොත්පත් වලින් එම ශේෂ අනාවරණය නොවන බැවින් උපලේඛන ඉදිරිපත් කිරීමට නොහැකි බව | ගිණුම් ශේෂයන්ට අදාළ ලේඛන, උපලේඛන හා ලිපිගොනු පිළියෙල කල යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | | | |
| (අ) | අංක 26/92 හා 1992 අගෝස්තු 19 චක්‍රලේඛය | සභාවේ වාහන 02 ක බදෙහි රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | අංක 30/2016 හා 2016 දෙසැම්බර් 29 දිනැති චක්‍රලේඛය | සභාව සතු ධාවන තත්වයේ පවතින වාහන 02 ක ඉන්ධන දහනය වසර 02 ක කාලයක සිට පරික්ෂා කර නොතිබුණි. | ඉන්ධන දහනය පරික්ෂා කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | අංක 2018/02හා 24 ජනවාරි 2018 දිනැති චක්‍රලේඛයේ | මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කර නොතිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.861,470 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.871,619 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් දිනට 31 මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් දිනට 31 මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i). වරිපනම් හා බදු | 781,500 | 585,373 | 605,048 | 280,875 | 536,000 | 551,165 | 467,145 | 300,550 |
| (ii). කුලී | 4,709,800 | 844,209 | 854,740 | 723,020 | 3,902,440 | 1,231,131 | 1,205,735 | 733,551 |
| (iii). බලපත්‍ර ගාස්තු | 218,000 | 279,960 | 279,960 | 21,750 | 328,000 | 67,700 | 67,700 | 21,750 |
| (iv). වෙනත් ආදායම් | 9,376,677 | 5,670,348 | 5,155,518 | 4,757,583 | 3,022,300 | 2,527,175 | 2,183,648 | 4,242,753 |
| එකතුව | 15,085,977 | 7,379,890 | 6,895,266 | 5,783,228 | 7,788,740 | 4,377,171 | 3,924,228 | 5,298,604 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) කුලී** | | |
| සතිපොල කඩ කාමරයක බදු ගැනුම්කරුවෙකුගෙන් 2021 දෙසැම්බර් සිටඉකුත් වර්ෂයේ ඔක්තෝම්බර් දක්වා කාලයට අදාළ රු50,925. ක හිඟ කඩ කුලී අයකර නොතිබුණි. | පැරණි ටෙන්ඩර්කරුට කුමන කඩකාමරය ලබාදීමට හෝ නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බව. | හිඟ ආදායම් අයකර ගැනිමට කටයුතු කළ යුතුය. |
| **(ආ) වෙනත් ආදායම්** | | |
| I. සමාලෝචිත වර්ෂය අවසානයට අයවීමට තිබූ හිඟ ජල ආදායම රු 466,200.ක් වූ අතර ඉන් රු 111,112. ක් ජල සැපයුම විසන්ධි කල පරිභෝගිකයින් 57 දෙනෙකුගෙන් අයවිය යුතු ශේෂයක් විය. | අයකරගැනීමට කටයුතු කරමින් පවතින බව. | හිඟ ආදායම් අයකර ගැනිමට කටයුතු කළ යුතුය. |
| II. ලග්ගල පැරණි රෝහලෙහි නිල නිවාස වලින් අයවිමට ඇති ජල ගාස්තු හිඟය රු 161,523.ක් අයකර නොතිබුණි. | විස්තර දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක කාර්යාලයට යැවීමට කටයුතු කරන බව | හිඟ ආදායම් අයකර ගැනිමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අවිධිමත් ගනුදෙනු**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| දින සිට 01 ඔක්තෝබර් 2019සභාවේ තාක්ෂණ නිලධාරි තනතුරේ වැඩ බැලීමට පත්කර තිබුණු නිලධාරියෙකුට වැඩ බැලීමේ දීමනාවට අමතරව කාර්යාලයට පැමිණීම වෙනුවෙන් ගමන් වියදම් සංයුක්ත දීමනා ලෙස 2019 සැප්තැම්බර් සිට 2022 ජූලි .කාලයට අදාලව රු.146,101 ක් ගෙවා තිබුණි. | වැටුපෙන් කොටස් වශයෙන් අයකර ගැනිමට කටයුතු කරන බව. | නිලධාරියාගෙන් අයකර ගැනිමට කටයුතු කළ යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | විශේෂ අවශ්‍යතා සහිත ගම්මන වැඩසටහනෙහි ප්‍රතිපාදන මත 2021 වර්ෂයේ සිට ඉදිකිරීම් ආරම්භ කර තිබූ කිවුලවාඩිය ජල යෝජනා ක්‍රමය මඟින් පාරිභෝගිකයන් 110 කට ජලය සැපයීමට අරමුණ කර තිබුණද, 2022 නොවැම්බර් 02 දින වන විට ඉන් කොටසක් ඉදිකර රු.2,377,539 ක් වැයකර තිබුණි. එමඟින් පාරිභෝගිකයින් 12 කට ජලය සැපයීමට හැකිව තිබුණද,සමාලෝචිත වර්ෂය අවසන් වන විට කිසිදු පාරිභෝගිකයෙක් ජල සම්බන්ධතා අයදුම්කර නොතිබුණි. ඒ හේතුවෙන් ඒ සඳහා වැය කළ රු.2,377,539 ක් නිශ්කාර්ය වියදම් බවට පත්ව තිබුණි. | පිරිවැය ඉහළ යාම මත වැඩි පාරිභෝගිකයින් පිරිසක් සිටින ස්ථාන වලට ජල නල එළීමට නොහැකි වීම මත ජල සම්බන්ධතා ලබාදීමට නොහැකි බව. | වැඩි පාරිභෝගිකයන් ප්‍රමාණයකට පානීය ජලය ලබාදීම කෙරෙහි අවධානය යොමුකළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ ක එකතුව 12 12,374,008.රුක් වූ අතර ඉන් වසර සිට 01 ත් අතර කාලපරාසයට අයත් 03 වසර 990,423.රුක් හා වසර කට වැඩි 05 කාලයක් තිස්සේ පැවති එකතුව 11,383,585.රුක් අයකර ගෙන නොතිබුණි | හිඟ ශේෂයන්වලට අදාල තොරතුරු පවත්වා නොමැති බැවින් අයකරගැනීමේ හැකියාවක් නොමැති බව. | ශේෂ නිරවුල් කරගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසන් දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ ක එකතුව 05 8,316,598.රුක් වූ අතර ඉන් වසර සිට 03 743,808.අතර කාලයට අයත් රු 05 වසරක් හා වසර කට වැඩි කාලයක් තිස්සේ 05 7,572,790.පැවති එකතුව රුක් නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි . | ණයහිමි ශේෂයන් වලට අදාල තොරතුරු ප්‍රමාණවත් නොවන බැවින් නිරවුල් කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බව. | ශේෂ නිරවුල් කරගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාතික පාරිසරික පනත අනුව ව්‍යාපාර ආයතන 19 කට පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගැනිමකින් තොරව වෙළඳ බලපත්‍ර නිකුත් කර තිබූ අතර මේ හේතුවෙන් රු 85,500.ක ආදායම් අහිමි වී තිබුණි. | බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කරන බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කල යුතුය. |
| (ආ) | 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලය තුල ගොඩනැගිලි සංවර්ධන අයදුම්පත්‍ර 85 ක් ඉදිරිපත් කර තිබුණද ඉන් ගොඩනැගිලි අයදුම්පත්‍ර 52 කට අනුමැතිය ලබාදී නොතිබුණි. මේ සම්බන්ධව පසු විපරම් කර නොතිබුණු අතර සංවර්ධන බලපත්‍රක් 40 නිකුත් කර වසර සිට වසර 01 දක්වා 07 කාලයක් ඉක්ම ගොස් තිබුණද එම ගොඩනැගිලි සම්බන්ධව අනුකූලතා සහතික නිකුත් කර නොතිබුණි. | පසුවිපරම් සිදුකිරීමටත් අනුකූලතා සහතික නිකුත් කිරීමටත් කටයුතු කරන බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන ජල ව්‍යාපෘති 07 ක ජල පරිභෝජකයින් 248 ක් අතුරින් පාරිභෝජකයින් 105 දෙනෙකුට ජල මනු සවිකර නොමැති අතර ජල බිල් කිරිමේදී අවිධිමත් ක්‍රමයක් අනුගමනය කර තිබුණි. එසේම ජලය පිරිපහදු කිරීමක් සිදුව නොතිබුණි. | සභාවේ මූල්‍ය තත්වය සලකා කොටස් වශයෙන් ජල මනු සවිකිරීමට කටයුතු කරන බව. | ජල මනු සවි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2020/01 දිනැති අංක 28 අගෝස්තු 2020 ලේඛයෙන් මුදල් චක්‍රදරන රාජ්‍ය 371.රෙ.සංශෝධනය වූ මු කාරචප්‍ර (ආ)(2) කටයුතු නොකර වාහන සඳහා ඉන්ධන ලබා ගැනිම වෙනුවෙන් අවස්ථා 148 කදී එකතුව රු1,701., දිනකට ,ක් 213රු7.,සිට 500 78,430.රු ක් දක්වා පරාසයක් තුළ නිලධාරියෙකු වෙත දිගින් දිගටම අතුරු අග්‍රිම අවිධිමත්ව ලබාදී තිබුණු අතර අතුරු අග්‍රිමක් සඳහා 15 දින දක්වා 30 සිට දින 16 .මාදයකින් යුතුව පියවා තිබුණිකාල ප්‍ර | ඉදිරියේදී ඉන්ධන ඇණවුම් මගින් ඉන්ධන ලබාගැනීමට කටයුතු කරන බව. | ඉන්ධන ඇණවුම් ක්‍රම මහින් ඉන්ධන ලබාගැනිමට කටයුතු කළ යුතුය. |

## 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දින පැවති රු 8,197,144.ක වත්කම් ඒකක ක් හා අගය 05 ක් වසර 15 තක්සේරු කර නොමැති වත්කම් ඒකක දක්වා 08 සිට වසර 01 කාලයක සිට නිශ්ක්‍රීයව හා ඌණ උපයෝජිතව පැවතුණි. | කඩ කාමර ජන ශූන්‍ය ප්‍රදේශයක පිහිටීමත් වාහන ගර්භිත තත්වයට පත්වීමත් මත ඌන උපයෝජිත වී ඇත. පරිගනක හා උපාංග අලුත්වැඩියා කර භාවිතයට ගන්නා බව. | අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හැකි වත්කම් භාවිතයට ගැනීමටත් ඵලදායී කාර්යයකට යෙදවීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.5 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසන් දින වන විට ප්‍රාදේශිය සභාව භුක්ති විදින ඉඩම් ක 66 දේශිය ක අයිතිය ප්‍රා 45 හා ගොඩනැගිලි සභාවට පවරාගෙන නොතිබුණි | ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු ලබාගෙන ගිණුම්ගත කිරිමට කටයුතු කරන බව | වත්කම්වල අයිතිය පවරාගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසන් දිනට පැවති කාර්යාල ලි බඩු උපකරණ ක 136 වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි කරන බව. | තක්සේරු කර ගිණුම් ගත කළ යුතුයි. |
| (ඇ) | ප්‍රාදේශීය සභාව පරිහරණය කරන සුසාන භූමි පුස්තකාල ,ක් 02 ඩා පිටිත් ,ක් 27 ,ජා ශාලාප්‍ර ,ක් 03 ගොඩනැගිලි හා ඉඩම් පෙර පාස ,නිල නිවාසයල් ගොඩනැගිලි සහිත ඉඩම් ක වටිනාකම තක්සේරු 19 .කර ගිණුම්ගත කර නොතිබුණි | -එම- | -එම- |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය සැසදිමේදී තනතුරු ක නිලධාරින් 06 දෙනෙකු 08 පුරප්පාඩුව පැවතුණි. | මේ සම්බන්ධයෙන් ඉහළ කළමනාකාරිත්වය දැනුවත් කිරීමට කටයුතු කර ඇති බව. | පුරප්පාඩු සම්පූර්ණ කරවාගත යුතුය. |

**4.** **ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය**

**තිරසර සංවර්ධන ඉලක්ක_**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| දරන තිරසාර සංවර්ධන පනතේ 19 අංක 2017 දේශිය සභාව විසින් විධිමත් නියමයන්ට අනුව ප්‍රා පරිදි තිරසාර සංවර්ධන අරමුණු හදුනාගෙන යාත්මක කරක්‍රිනොතිබුණි. | සභාවේ මූල්‍ය තත්ත්වය අයහපත් වීම හේතුවෙන් අරමුණු කරා ළඟාවීමට නොහැකි වීඇති බව | තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කළ යුතුය. |